# සමෘද්ධි සංවර්ධන
## දෙපාර්තමේන්තුව
## சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
## Department of Samurdhi Development

ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்ப கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT


මගේ අංකය / எனது இல / My No: DSD/HO//05/MF/02/09 ඔබේ අංකය / உமது இல / Your No: ........................ දිනය / திகதி / Date: 2019.03.18

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2019/04**

**සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරුවන්/ බැංකු සමිති කළමනාකරුවන් වෙත**

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු සඳහා ජාතික ක්‍රියාකාරී සැළැස්ම</u>**
**<u>හඳුන්වා දීම - 2019</u>**

## 1. හැඳින්වීම

මේ වන විට දිවයින පුරා සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1073 ක් හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති 331 ක් ක්‍රියාත්මක වේ. 1995 දිළිඳුකම පිටුදැකීමේ අරමුණ ඇතිව ආරම්භ කරන ලද සමෘද්ධි ජාතික සංවර්ධන වැඩසටහන යටතේ අඩු ආදායම් ලාභීන්ට ක්ෂුද්‍ර මූල්‍යකරණ පහසුකම් සැපයීම සඳහා ක්‍රියාත්මක වූ මෙකී ආයතන පද්ධතිය එකී අරමුණු ඉටු කර ගැනීමේ ලා විවිධ ප්‍රමාණයන්ගෙන් දායකත්වය සපයමින් සිටි.

වඩාත් විශ්ලේෂණාත්මකව බලන කල වසර 22 ආසන්න කාළයක් පුරා ක්ෂුද්‍ර මූල්‍ය කරණයේ නියලී සිටින සමෘද්ධි බැංකු, විවිධ බාධක හා අභියෝග හමුවේ අඩු ආදායම්ලාභීන්ට වඩාත් ජනතා හිතවාදීව ක්ෂුද්‍රමූල්‍යකරණ සේවාවන් සපයනු ලබයි .මේ වන විට තැන්පතු රාශීකරණයේ හා ක්ෂුද්‍රමූල්‍ය ණය ගලා යාමේ ආකර්ශණීය වර්ධනයක් අත්පත් කරගෙන ඇති බවද කිව යුතුය.මෙකී බැංකු පද්ධතිය මනා කළමණාකාරිත්වයකින් යුතුව හැසිරවීම තුලින් අඩු ආදායම්ලාභීන්ගේ මූල්‍ය අවශ්‍යතා සපයන කාර්යක්ෂම හා ඵලදායි මූල්‍ය ආයතනය බවට සමෘද්ධි බැංකුව පත් කිරීමේ හැකියාව ඇත.එහිදී ප්‍රජා මූල බැංකු සමිතියට ද විශේෂ කාර්යය භාරයක් පැවරේ.

2013 අංක 1 දරණ සමෘද්ධි පනත මගින් සමෘද්ධි බැංකු හා බැංකු සමිතිවලට පැවරෙන අරමුණු පරමාර්ථ , බලතල හා කාර්යයන් පෙන්වා දී ඇති අතර, ඒ පිළිබඳව මනා අවබෝධයකින් කටයුතු කිරීමද අත්‍යාවශ්‍ය වේ.

ඕනෑම ආයතනයක හෝ වැඩසටහනක සාර්ථකත්වය රඳා පවතින්නේ එම ආයතනයේ හා වැඩ සටහන්හි අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීමේ ප්‍රමාණය මතය.

ආයතනයක අරමුණු හා පරමාර්ථ ඉටු කරගැනීමට නම් දිඟු කාලීනව ඒ සඳහා යොමු වූ ක්‍රමෝපා සැළැස්මක් හා ඒ හා බැඳුනු ක්‍රියාකාරී සැළැසුම් තිබීම අත්‍යාවශ්‍ය වේ.මේ සඳහා අවස්ථා කීපයකදීම සමෘද්ධි බැංකු වෙත මග පෙන්වීම් කර තිබුණද, එහි අපේක්ෂිත ඉලක්ක අත්පත් කර ගැනීමට හැකියාව නොලැබුණි.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

මෙම කරුණු සලකා බලා අඩු ආදායම්ලාභින්ගේ ආදායම් හා ජීවන තත්වයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණින් 2019 වර්ෂයේ සිට සමෘද්ධි ප්‍රජා මූල බැංකු පද්ධතිය සැළසුම් සහගතව මෙහෙය වීම සඳහා ජාතික මට්ටමින් ක්‍රියාකාරි සැළස්මක් හඳුන්වා දීම මෙමගින් අපේක්ෂා කෙරේ

## .2.සමෘද්ධි ප්‍රජා මූල බැංකු සඳහා ජාතික ක්‍රියාකාරී සැළැස්ම-2019වර්ෂය

සමස්ථ ප්‍රජා මූල බැංකු පද්ධතිය සාර්ථක ගමන් මගක් කරා සැළසුම් සහගත මෙහෙය වීමක් සිදු කිරීම ප්‍රධාන පරමාර්ථ කරගෙන 2019 වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම වඩා සුදුසු බව පෙනී යයි.

2018 වර්ෂය අවසාන කාර්තුවේ මෙම උපදෙස් නිකුත් කිරීමට කටයුතු කර තිබුණද පාලනය කල නොහැකි හේතු සාධක මත මේ වන තෙක් චක්‍රලේඛනය නිකුත් කිරීම ප්‍රමාද වූ බවද මෙමගින් මතක් කරමු.
මෙම වර්ෂයේ සිට වඩාත් සැළසුම් සහගතව පනතේ සඳහන් අරමුණු හා ඒ හා බැඳුණු අනෙකුත් පහත සඳහන් අරමුණු දිනා ගැනීම සඳහා සෑම සමෘද්ධි බැංකුවක්ම අඛණ්ඩව ක්‍රියා කළ යුතුවේ

## 2.1අරමුණු

1. අඩු ආදායම් ලාභීන්ගේ විවිධ අවශ්‍යතා වෙනුවෙන් ණය අරමුදල් සම්පාදනය කරමින් ගුණාත්මක ණය කළඹක් වර්ධනය කර ගැනීම
2. ඉලක්කගත කණ්ඩායමේ ඉතුරුම් පුරුදු වර්ධනය කරමින් එම ඉතුරුම් සමෘද්ධි බැංකු වෙත ගලා ඒමට කටයුතු කිරීම
3. අඩු ආදායම් ලාභින් අවිධිමත් ණය මූලාශ්‍ර වෙත ලඟා වීම අවම කිරීම තුලින් ඔවුන් සමෘද්ධි බැංකු වෙත අද්දවා ගැනීමට කටයුතු කිරීම
4. බැංකුවේ ණය අවධානම කළමණාකරණය කිරීමින් අක්‍රිය ණය සම්මත මට්ටමට ලගා කර වීම
5. සමෘද්ධි ප්‍රජා මූල බැංකුව තිරසාර මූල්‍ය ආයතන බවට පත් කිරීම (ලාභ දායි ඒකක බවට පත් කිරීම.)
6. බැංකු විසින් සපයන සේවාවන් පුළුල් කරමින් සමාජීය වගකීම් ඉටුකරන මූල්‍ය ආයතන බවට සමෘද්ධි බැංකුව පත් කිරීම(මානසික හා සාමාජීය සවිබල කරණයට දායක වීම)
7. බැංකුව ජනහිතවාදි ආකර්ශණීය වූ අභ්‍යන්තර හා බාහිර පරිසරයක් නිර්මාණය කිරීම
8. සමෘද්ධි බැංකුව නවීකරණය (Modern Bank) කිරීම (සමෘද්ධි බැංකු පරිගණකගත කිරීමේ ක්‍රියාවළිය කඩිනම් කිරීම.)
9. බැංකු කාර්යය මණ්ඩලය අභිප්‍රේරණය කිරීම

## 2.2 අරමුණු ඉටුකර ගැනීමටඅදාලව ඉලක්ක හා වර්ධන අනුපාත සකස් කිරීම

ඉහත අරමුණු දිනා ගැනීම සඳහා 2019 වර්ෂයේදී සෑම සමෘද්ධි බැංකුවක් විසින්ම ක්‍රියාකාරි සැළැස්මක් සකස් කළයුතු වේ.

එහිදි තම බැංකුවට 2019 වර්ෂය තුල ලඟා කර ගත හැකි ඉලක්කයන් පිහිටුවා ගත යුතු අතර ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් ඒ ඒ බැංකුවට හෝ ග්‍රාමනිළධාරි වසම් සඳහා ඉලක්ක ලබා නොදේ.ග්‍රාම නිළධාරි වසමේ සිට ජාතික මට්ටම දක්වා පහල සිට ඉහලට ඉලක්ක ගලා යාමක් වන පරිදි ජාතික ,දිස්ත්‍රික් , බැංකු සමිති මට්ටම දක්වා ඉලක්ක සකස් කර ග්‍රාම නිළධාරි හා බැංකු මට්ටමේ දි ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ

යුතුය.එසේ වුවද මෙමගින් මග පෙන්වීම් කරන ලද ජාතික මට්ටමේ අපේක්ෂිත අවම ඉලක්ක ඉක්මවා කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### **2.3** ජාතික ඉලක්ක

| ක්‍රියාකාරකම | වාර්ෂික ඉලක්ක | කාලසීමාව |
|---|---|---|
| 1.පිටිහිටි ණය කළඹෙහිගුණාත්මක බව පවත්වා ගනිමින් පිටිහිටි ණය කළඹ වර්ධනය කිරීම | 20% | 2019.01.01 සිට 2019.12.31 දක්වා |
| 2.ණය මුදා හැරීමේ සමුච්චිත ණය ගිණුම් සංඛ්‍යාවේ වර්ධනය | 5% | 2019.01.01 සිට 2019.12.31දක්වා |
| 3.සාමාජික කොටස් ඇතුළු තැන්පතු මුදල් රැස් කිරීම වර්ධනය කිරීම. (අනිවාර්ය ඉතුරුම් හැර) | 16% | 2019.01.01 සිට 2019.12.31දක්වා |
| 4.සාමාජික කොටස් ඇතුළු තැන්පතු ගිණුම් සංඛ්‍යාව වර්ධනය කිරීම (අනිවාර්ය ඉතුරුම් හැර) | 3% | 2019.01.01 සිට 2019.12.31දක්වා |
| 5.පැහැර හැරි ණය සම්මත මට්ටමක තබා ගැනීම | මාස 09 ට අඩු (කල් පසු වූ ණය) - 4 % *<br>මාස 09 ට වැඩි (බොල් ණය ) - 2 % | 2019.01.01 සිට 2019.12.31දක්වා |
| 6. වර්ෂය තුල මුළු ආදායම තුල ණය පොලී ආදායම | 50% | 2019.01.01 සිට 2019.12.31දක්වා |
| 7.කේවල ශේෂ පිරික්සුම් තුලනය කිරීම | 100% | 2019.01.01 සිට 2019.12.31දක්වා |
| 8. තිරසාර බැංකු ඒකක බවට පත්කිරීම හා අඛණ්ඩව පවත්වාගෙන යාම. | 100% | 2019.01.01 සිට 2019.12.31 දක්වා |
| 9.ඉලක්ක ගත භෞතික සම්පත් සංවර්ධනය | සැළසුමට අදාලව | 2019.01.01 සිට 2019.12.31දක්වා |
| 10.විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම | අදාල කාලය තුල කඩිනමින් විගණන විමසුම් ලැබී දින 14 ක් ඇතුළත. | 2019.01.01 සිට 2019.12.31 දක්වා |
| 11.මාසික,වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම | නිවැරදි හා නියමිත කාලවකවානු වලට | 2019.01.01 සිට 2019.12.31 දක්වා |
| 12 අඩු අදායම්ලාභීන්ගෙන් අවම වශයෙන් වසමකට එක් අයකුවත් ආර්ථික වශයෙන් සවිබලගැන්වීම් මගින් සහනාධාර මානසිකත්වයෙන් මුදවාගැනීම. | ග්‍රාම නිලධාරී වසමට ප්‍රතිලාභි 01 | 2019.01.01 සිට 2019.12.31 දක්වා |
| 13. බැංකු සඳහා පරිගණක වැඩසටහන හඳුන්වාදීම. | දිස්ත්‍රික්කයකට බැංකු 04 | 2019.05.01 සිට 2019.12.31 දක්වා |

* අවදානම්ගත ණය කළඹ අනුපාතය (PAR) සැළකිය යුතුය. එනම් කල්පසුවූ ණය මුදලේ මුළු පිටහිටි ශේෂයම ගණනය කිරීමේදි සැළකිල්ලට ගත යුතුය.

මෙම ජාතික ඉලක්ක සකස් කර ඇත්තේ වර්ෂ කිහිපයක ජාතික මට්ටමට වර්ධන උපනතීන් සළකා බැලීමෙනි.බැංකු සංගම් මට්ටමේදි ඉලක්ක සකස් කිරිමේදි අවම වශයෙන් පසුගිය වර්ෂ 03ක උපනතීන් පිළිබඳව ගණනය කර එහි වර්ධන ප්‍රතිශත ජාතික ඉලක්ක සමඟ සැසඳීමක් කළ යුතුය.
අරමුණු ලඟා කර ගැනීමේ කාර්යය සාධන මට්ටම් (KPI) දර්ශක ජාතික ඉලක්ක පදනම් කරගෙන මිනුම් කෙරෙනු ඇත.

උදා : **බැංකු මට්ටමේදි සමාජික කොටස් ඇතුළු තැන්පතු සඳහා ඉලක්ක නියම කිරිමේදි,** පසුගිය වර්ෂ 03 හෝ 04 වර්ධන උපනතීන් පිළිබඳ ගණනය කර එහි වර්ධන ප්‍රතිශතයන් හා ජාතික ඉලක්කයන් සමඟ සමාලෝචනය කර ඉදිරි පුරෝකථනයන් සිදු කළ යුතුය.යම් බැංකුවක් වර්ධනීය තත්වයක් පෙන්නුම් නොකරන අවස්ථා වකදී ජාතික ඉලක්ක අවම ඉලක්ක ලෙස පිහිටා තම බැංකුවේ ඉලක්ක සකසා ගතයුතුය.ඒ අනුව අනෙකුත් ඉලක්කයන්ද සකසා ගැනීමට කටයුතු කලයුතුය.

මෙසේ ඒ ඒ ක්ෂෙත්‍ර සම්බන්ධව ඉලක්ක පිහිටුවා ගැනීමේදි ඒ සම්බන්ධ පුළුල් විශ්ලේෂණයන් සිදුකළ යුතු අතර පොදුවේ පහත සඳහන් මූලික දත්තයන් කෙරේ අවධානය යොමු කිරිම වැදගත්වේ.

I. සමෘද්ධි ලාභින් නොවන අඩු ආදායම්ලාභීන්
II. අක්‍රිය කොටස්කරුවන්
III. කොටසක සාමාන්‍ය
IV. අක්‍රිය තත්වයේ පසුවන කුඩා කණ්ඩායම්
V. අක්‍රිය තැන්පතු සංඛ්‍යාවන්
VI. ඉලක්ක කණ්ඩායමේ ආදායම් මට්ටම
VII. ඉලක්ක පිරිසේ සාර්ථක ව්‍යවසායකයින්
VIII. බැංකු බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරි වසම්,ජනගහන ව්‍යුහය,
IX. තම තරඟ කරුවන්(වෙනත් මූල්‍ය ආයතන)
X. තම ගනුදෙනුකරුවන්ගේ ණය ගැති භාවය
XI. මූල්‍ය සාක්ෂරතා දැනුම

ඒ ඒ කේෂත්‍ර සම්බන්ධ යෙන් ඉලක්ක පිහිටු වීමේදි ඒ සඳහා ඇඩිව බලපෑම් කරනු ලබන කරුණු පිළිබඳව ගැඹුරින් අධ්‍යනය කළයුතුය.

උදා : ඉතුරුම් ගිණුම් වර්ධනයේදි ,අක්‍රිය කොටස් කරුවන් ,කොටසක සාමාන්‍ය,ළමා ජනගහනය, සමෘද්ධිලාභීන් නොවන අඩු ආදායම්ලාභීන්,කාන්තා ජනගහනය ආදි වශයෙනි.

බැංකුවට අරමුණු දිනා ගැනීමට තව දුරටත් පවතින විභවතාවයන් හඳුනා ගත යුතු අතර, දිඝකාලීනව හා කෙටිකාලිනව ලඟා කර ගත හැකි ඉලක්කයන් පිහිටුවා ගත යුතුය.බැංකු විසින් සැළසුම් සකස් කිරීමේදි, සිදු කරනු ලබන ක්‍රියාකාරකම් මත තම බැංකුවට අනන්‍ය වූ සැළසුම් සකස් කිරීම වඩාත් ප්‍රායෝගික වේ.

උදා -: වශයෙන් පහත පරිදි අංශ අනුව වර්ග කර සැළසුම් සකසා ගත හැකිය.

- ණය
- තැන්පතු ප්‍රවර්ධනය
- අවධානම් කළමණාකරණය
  (ණය මුදා හැරීම ,කල් පසු වූ ,බොල්ණය අනුපාත ප්‍රශස්ථ මට්ටමේ තබා ගැනීම මෙහෙයුම් කළමණා කරණය,ද්‍රවශීලතා)
- ලාභදායිත්වය
- ප්‍රජා සජීවිකරණය(කණ්ඩායම් සක්‍රිය කිරීම,දැනුවත් කිරීම්)
- ව්‍යවසායක (නව ව්‍යවසායකයින් බිහි කිරීම,ආර්ථික සවිබල කරණය)
- යටිතල පහසුකම් සංවර්ධනය(බැංකු පරිශ්‍ර)
- ඵලදායිතාව(එස් 5 සංකල්පය, අවම වශයෙන් පිළිවෙල,පිරිසිදුකම,පිරිමැස්ම)
- බැංකු ප්‍රවර්ධනය
- යහපාලන මූලධර්ම(විනිවිදබව සාධාරනබව.,සමානාත්මතාව.....)
- ප්‍රගති සමාලෝචන ඇගයීම්

අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමේ ලා ඒ ඒ බැංකු විසින් තම තමන්ට විශේෂිත වූ අංශ සඳහා විවිධ ක්‍රියා කාර කම් සිදු කළ හැකිය.ඒ අනුව අරමුණට අදාල ව ක්‍රියාකාරකම් පිහිටු වීම සඳහායම් මග පෙන්වීමක් මෙමගින් ලබා දෙනු ඇත.

ණය, තැන්පතු,ලාභදායිත්වය,ණය අවදානම් කළමණාකරණය,ආර්ථික සවිබලකරණය යන ප්‍රධාන අංශ සඳහා ඉලක්ක නියම කිරීමේදී, පොදුවේ ලඟා විය හැකි අවම ඉලක්ක ඉක්මවා තම බැංකුවේ බැංකු සමිතියේ ධාරිතාවය හා ක්‍රියාකාරිත්වය අනුව එම ඉලක්ක පිහිටුවා ගැනීමට කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

විශේෂයෙන් තැන්පතු ප්‍රවර්ධනය සම්බන්ධ ඉලක්ක පිහිටු වීමේදී ක්ෂුද්‍ර මූල්‍ය අංශය විසින් හඳුන්වා දී ඇති ජාතික හා ආගමික උත්සව මුල් කර ගත් ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන්ද,අළුත් අවුරුදු විශේෂ ඉතුරුම් වැඩසටහන්ද සැළකිල්ලට ගනිමින් ඉලක්ක ගණනය කළ යුතුය.

### 3. ග්‍රාම නිළධාරි වසමට වාර්ෂික ඉලක්ක ලබා දීම'

බැංකු මට්ටමින් සකස් කරන ඉලක්ක අතරින් පහත සදහන් ඉලක්ක ළඟා කර ගැනීමට වසම් මට්ටමින් සමෘද්ධි සංවර්ධන නිළධාරින්ටද වගකීම් පවරනු ලැබේ.

- තැන්පතු ගිණුම් ආරම්භ කිරීම හා තැන්පතු මුදල් රැස්කිරීම
- ණය කළඹ ගුණාත්මක ලෙස වර්ධනය කිරීම
- පැහැර හැරි ණය අනුපාත සම්මත මට්ටමේ තබා ගැනීම
- කුඩා කන්ඩායම් සක්‍රිය මට්ටමින් පවත්වාගෙන යාම
- සාර්ථක ආදායම් උත්පාදන ව්‍යාපෘති හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම(සවිබල ගැන්වූ පවුල්)

සමානුපාතික ඉලක්ක බෙදා හැරීම වෙනුවට, ඒ ඒ වසම්හි පවතින විභවතාවයන් සළකා බලා ඉලක්ක ලබා දීම සුදුසු බව යෝජනා කරමු.ඉලක්ක සැකසීම ,උපාය මාර්ග හඳුනා ගැනීම හා වාර්තා සැකසීම යනාදි කරුණු වලදී බැංකු කළමණාකරුවන් තම කලාපයේ සංවර්ධන නිළධාරීන්ට නිසි මගපෙන්වීම් කළයුතුය.සංවර්ධන නිලධාරින්ගේ කාර්ය සාධන මිනුම් කිරීමේදි ඔවුන් මේ වෙනුවෙන් කරන ලද දායකත්වය සැලකිල්ලට ගත යුතුය.තම බල ප්‍රදේශයට අනුයුක්තව සේවය කරනු ලබන ක්ෂේත්‍ර සංවර්ධන නිළධාරින්ගෙන් ඵලදායි හා කාර්යක්ෂම සේවාවක් ලබා ගැනීම සඳහා ඔවුන් මෙහෙය වීම බැංකු හා බැංකු සමිති කළමණාකරුවන්ගේ ප්‍රධාන වගකීමක්වේ.

**3.1 ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදි සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියේ කාර්ය භාර්ය**

ක්ෂුද්‍ර මූල්‍ය අංශය මගින් හඳුන්වා දෙනු ලබන සමෘද්ධි ප්‍රජාමූල බැංකු ක්‍රියාකාරි සැළැස්ම හුදෙක් ග්‍රාම නිළධාරි වසම හෝ බැංකු මට්ටම පමණක් ආවරණය වන සැළැස්මක් නොවේ. බැංකු පද්ධතියට සෘජුවම දායකත්වය දරන ප්‍රජාමූල බැංකු සමිතිය හා දිස්ත්‍රික් නියෝජනය වන අයුරින් සැකසූ සැළැස්මක් බව අමතක නොකල යුතුය.

එනම් ප්‍රජා මූල බැංකු සමිතිය යනු තම බල ප්‍රදේශයට අයත් සමෘද්ධි බැංකු මෙහෙය වන හා අධීක්ෂණය කරනු ලබන කේද්‍රීය ආයතනය වේ.ඒ අනුව තම බල ප්‍රදේශයට අයත් සියළුම බැංකු විසින් සකස් කරනු ලබන ක්‍රියාකාරි සැළසුම්, ඒකාබද්ධව ගත් විට අදාල ප්‍රජාමූල බැංකු සමිතියේ ක්‍රියාකාරි සැළස්ම නිර්මාණය වේ.එහිදි ප්‍රජාමූල බැංකු සමිතියේ වගකීම් කාර්යය භාර්යය ද ඇතුලත් කරමින් සමිතියේ ක්‍රියාකාරි සැළැස්ම නිර්මාණය වේ.

මේ අනුව පහත සඳහන් කාර්ය භාර්ය ප්‍රජාමූල බැංකු සමිතියට පැවරෙනු ඇත.

I. ග්‍රාම නිළධාරි වසම් හා බැංකු මට්ටමේදි ඉලක්ක සපුරා ගැනීමේ හැකියාව සොයා බැලීම
II. ඒ සඳහා දියත් කරනු ලබන ත්‍රියාකාරකම්හි යෝග්‍ය බව පිරික්සීම.
III. ක්‍රියාත්මක සැළැස්ම සැකසීමේ සිට අරමුණු දිනාගැනීම දක්වා වූ පසු විපරම් ක්‍රියාවලිය
IV. සමස්ථ ප්‍රගතිපාලන ක්‍රියාවලිය

ඒ අනුව ග්‍රාම නිළධාරි වසමකින් හෝ බැංකු වකින් අදාල සැළැස්ම නියමිත දිනට සකස් නොකිරීම හෝ ලබා නොදීම, ඉලක්කයන් නොගැලපීම හා අරමුණුගත ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු නොකිරීම. යනාදි කරුණු සම්බන්ධයෙන් ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරු ඇතුළු කාර්ය මංඩලය වග කීමට බැදෙනු ඇත..

**4.සැළසුම් සකස් කර ඉදිරි පත් කිරීම**

| මට්ටම | වතකීම් දරන නිළධාරියා | සැළැසුම් යොමු කල යුතු අංශය | භාවිතා කලයුතු ආකෘති පත් | එවිය යුතු දිනය |
|---|---|---|---|---|
| ග්‍රාම නිලධාරි වසම | සමෘද්ධි සංවර්ධන නිළධාරියා | බැංකුව | ඇමුණුම 01 | ඇමුණුම අංක 4 (කාල රාමුව) |
| බැංකුව | බැංකු කලමණාකරු | බැංකු සමිතිය | ඇමුණුම අංක 2-1 සිට 2 - 10 | |
| බැංකු සමිතිය | සමිති කලමණාකරු | දිස්ත්‍රික් සමෘද්ධි අංශය | ඇමුණුම 3-1 - 3.6 | |
| දිස්ත්‍රික් සමෘද්ධි අංශය | දිස්ත්‍රික් බැංකු විෂය කලමණාකරු | ක්ෂුද්‍රමූල්‍ය අංශය | ඇමුණුම 3-1 - 3-6 | |

ඉහත පැහැදිළි කිරීම් අනුව ඒ ඒ කේෂ්ත්‍ර මට්ටමේදි , සැළසුම් සකස් කිරිමට යොදා ගත හැකි ආකෘති පත්‍ර ඉහත සටහන මඟින් දක්වා ඇත. එම ආකෘති භාවිතා කරමින් ප්‍රායෝගික වන යථාර්තවාදි ඉලක්කයන් පිහිටුවා ඒ ඒ අරමුණු ලගා කර ගැනීම උන්නදු විය යුතු අතර, එකම අංශයන්ට කොටු නොවී සවාධීනව සැළසුම් සකස් කිරීමට ඔබ මෙහෙවිය යුතුය.මෙකි ක්‍රියාවලියට අදාල කාල රාමුව ඇමණුම අංක 4 මගින් දක්වා ඇත. සමෘද්ධි බැංකු හා බැංකු සමිති සකස් කරන ලද ක්‍රියාකාරි සැළැස්මේ පිටපත් ක්ෂුද්‍ර මූල්‍ය අංශයට එවීමට කටයුතු නොකළ යුතුය. .බැංකුවලට අදාලව ඉලක්ක පිහිටුවීමේදී ඊට අදාල වන දර්ශක / අනුපාත පිළිබඳ මඟ පෙන්වීම් ඇමණුම අංක 5 මඟින් දක්වා ඇත.

ඉහත උපදෙස් පරිදි දිස්ත්‍රික්කයටඅදාල ක්‍රියාකාරී සැලැස්ම සකසා 2019.04.30 දිනට ප්‍රථම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත පහත සඳහන් විද්‍යුත් ලිපිනය මගින් ලබා දීමට කටයුතු කළ යුතුය. ඉදිරියේදී තම ආයතන සම්බන්ධ ව සිදු කරනු ලබන ප්‍රගතිය ඇගයීම්, එසේම සියළු ඇගයීම් හා ශ්‍රේණිගත කිරීම් වැඩසටහන් වලදී මෙහි ක්‍රියාකාරකම් වල සාර්ථක අසාර්ථකභාවය ද මිනුම් කෙරෙන බවද දන්වනු කැමැත්තෙමි. එබැවින් තම දිස්ත්‍රිකකයට යථාර්ථවාදී වන සැලසුම් ඉදිරිපත් කිරීමට කළමනාකාරීත්වය වග බලා ගත යුතු බවට උපදෙස් ලබා දෙමි.

ඊමේල් ලිපිනය mfdevelopment2018@gmail.com පසු ගිය වසර තුලද මේ සඳහා කිසියම් මඟ පෙන්වීමක් සිදු කළද එය එතරම් සාර්ථකව ක්‍රියාත්මක නොවුනි. වසර 20 කට වැඩි අත්දැකීම් සහිත ඔබට මෙම කාර්යය එතරම් සංකීර්ණ කටයුත්තක් නොවන බැවින් මෙම වසරේ මේ සඳහා අදාල නිළධාරින්ගේ සක්‍රිය මැදිහත්වීම අදාල කාලරාමුව තුලම සිදු කිරීමට උපදෙස් ලබා දෙමි. මෙම වර්ෂයේ සිට අඛණ්ඩව මෙම උපදෙස් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අපේෂා කරන බවද වැඩිදුරටත් මතක් කරමි.

5. ප්‍රගති පාලන ක්‍රියාවලිය

කිසියම් ව්‍යාපෘතියක හෝ සංවර්ධන වැඩසටහනක සැළසුම් ගත කාලසටහනට හා ඉලක්කවලට පැවරී ඇති වැඩකොටස් ඉටුකර තිබේද යන්න සොයා බැලීම ප්‍රගති පාලනයෙන් සිදු කෙරේ ඕනෑම සංවර්ධන වැඩසටහනක් තත්කාලීනව හා අඛණ්ඩව මනා ප්‍රගති පාලනයකට හසු කිරීම අත්‍යාවශ්‍ය වේ.එමගින් ව්‍යාපෘතිය හෝ වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක වෙත යොමු වේද ,නොඑසේ නම් ඊට බාධක කවරේද යන්නත්,එම බාධක ඉවත් කර ගන්නේ කෙසේද, ඒ සඳහා වගකීම් දැරිය යුතු වන්නේ කවරෙක්ද යන්න ත් විමර්ශනය කර හඳුනා ගැනීමක් ඊට පිළියම් යෙදීමත් සිදුවේ.

ප්‍රගති පාලන ක්‍රියාවලියේදී සියළු දෙනාගේම සහභාගීත්වය ඉතා වැදගත් වන අතර, සැලසුමට අදාල සෑම පියවරකදීම ඒ ඒ කාර්යයන්ට අදාල වගකිව යුතු නිලධාරීන් විසින් පසු විපරම් හා මෙහෙයවීම් කල යුතු වේ. ප්‍රගති පාලනයකින් තොර සැලසුම්කරණය ආයතනයේ අසාර්ථක උත්සාහයන් වනු ඇත.

බොහෝ වැඩසටහන්, ව්‍යාපෘති අසාර්ථක වන්නේ ඒ සඳහා යොමු වූ අඛණ්ඩ ප්‍රගති පාලන ක්‍රියාවලියක් නොමැති බැවිනි.ඒ සඳහා සෑම පියවරකදීම ඊට යොමු වූ අඛණ්ඩ මෙහෙයවීමක් අවශ්‍ය වේ. ඉහත උපදෙස් පරිදි තම බැංකුවට හා බැංකු සමිතියට ක්‍රියාත්මක සැලැස්ම සැකසීමෙන් අනතුරුව සෑම පියවරකදීම ප්‍රගති පාලන ක්‍රියාවලිය සිදු කළ යුතුය. එහිදී ජාතික මට්ටමට, දිස්ත්‍රික් මට්ටමට, ප්‍රාදේශීය මට්ටමට හා බැංකු මට්ටමින් ප්‍රගති පාලනයක් සිදු වන පරිදි විධිමත් අධීක්ෂණයක් කලයුතුය.. විශේෂයෙන් සමෘද්ධි සංවර්ධන නිලධාරී විෂය ක්ෂේත්‍රයට අදාල වන ප්‍රා දේශීය හා බැංකු මට්ටමින් ප්‍රගති පාලන කටයුතු වලට විශේෂ අවධානයක් යොමු විය යුතුය. ඒ සඳහා පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කරමින් ප්‍රගති ඇගයීම් හා පසු විපරම් සිදු කළ හැකිය.

- වාර්තා ලබා ගැනීම.
- රැස්වීම් සාකච්ඡා පැවැත්වීම
- විශ්ලේෂණය සිදු කිරීම(කොටු දැල් භාවිතය)

| මට්ටම | කාලය | වගකීම් දරන නිලධාරියා | අධීක්ෂන දරන නිලධාරියා |
|---|---|---|---|
| බැංකු මට්ටම | මාස 01 ට වරක් | බැංකු කළමනාකරු | බැංකු සමිති කළමනාකරු |
| බැංකු සමිති මට්ටම | මාස 02 ට වරක් | බැංකු සමිති කළමනාකරු | ප්‍රාදේශීය ලේකම් |
| දිස්ත්‍රික් මට්ටම | මාස 03 ට වරක් | දිස්ත්‍රික් බැංකු විෂය | දිස්ත්‍රික් ලේකම්<br>දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ |
| ජාතික මට්ටම | මාස 06 ට වරක් | විෂය භාර කළමනාකරු | අධ්‍යක්ෂ ජනරාල්<br>දිස්ත්‍රික් ලේකම්<br>අධ්‍යක්ෂ බැංකු මූල්‍ය |

ඉදිරියේදී මෙම කටයුතු සාර්ථකව මෙහෙයවීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය අංශය මගින් විධිමත් ප්‍රගති සමාලෝචන ක්‍රමවේදයක් හඳුන්වා දීමට සැලසුම් කර ඇත.

**6. පොදු උපදෙස්**

01. ආයතන සංවර්ධයේදී සැලසුම්කරණයේ වැදගත්කම සලකා මෙම කාර්යයේදී පහළ සිට ඉහළට වගකීම් දරණ ලද නිලධාරීන් එම වගකීම් ඉතා වුවමනාවෙන් ඉටුකළ යුතුය.
02. ඉදිරියේදී සිදු වන ඇගයීම් මෙම කරුණු කෙරේ වැඩි බර තැබීමක් සිදුවන බවද නැවත මතක් කරමි.
03. තම ක්ෂේත්‍රයන්ට අදාල වන යථාර්තවාදී ඉලක්කයන් පිහිටුවා ගතයුතු සේම පොදුවේ නියම කර ඇති අවම ඉලක්ක ඉක්මවා කටයුතු කිරීමටකළයුතුය.
04. තවද ප්‍රගති සමාලෝචන සඳහා දැරීමට වන වියදම් බැංකු හා බැංකු සමිති විසින් ලබා දී ඇති මෙහෙයුම් උපදෙස් අනුව සිදු කිරීමට උපදෙස් ලබා දුනිමි.

මෙහි සඳහන් කරුණු සම්බන්ධව යම් ගැටළුවක් හෝ පැහැදිලි කිරීමක් හෝ වේ නම් ක්ෂුද්‍රමූල්‍ය අංශයේ පහත සඳහන් දුරකථන අංක අමතන මෙන් වැඩි දුරටත් දන්වා සිටිමි.

0112872227 - කළමණාකාරිණී ඩබ් .රුක්මා මානෙල්

**එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී.බණ්ඩාර,**

**අධ්‍යක්ෂ ජනරාල්.**

පිටපත්:

01.ලේකම්, ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය. - කා.දැ.පි.

02.සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, - කා.දැ.පි.

03. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.පි.

04. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.පි.

05. සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, - කා.දැ.පි.

06. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, - කා.දැ.පි.

07. සියලුම විධායක කමිටු සභාපතිවරුන්, සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතිය. - කා.දැ.පි.

08. සියලුම පාලක මණ්ඩල සභාපතිවරුන්, සමෘද්ධි ප්‍රජාමූල බැංකුව. - කා.දැ.පි.